**කලවාන ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 18 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කලවාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මඟින් විනාශ කිරීමට නිර්දේශ කර තිබුණු වත්කම් වල පිරිවැය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කර තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් රු. 26,595 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු අක්කර බදු ශේෂය රු. 148,143 ක් වුවත්, එය රු. 465,437 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ජංගම වත්කම් රු. 317,294 කින් වැඩියෙන් දැක්වුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු. 1,626,422 ක් වුවත්, එය රු. 1,689,712 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ජංගම වත්කම් රු. 63,290 කින් වැඩියෙන් දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල තථ්‍ය උසාවි දඩ ආදායම රු. 863,875 ක් වුවත්, එය රු. 512,283 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් මෙහෙයුම් ආදායම රු. 351,592 කින් අඩුවෙන් දැක්වුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කල යුතුව තිබුණු මුද්දර බදු රු. 8,995 ක් වුවත්, එය රු. 44,807 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් රු. 35,812 ක් වැඩියෙන් දැක්වුණි.

(ඊ) 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කර්මාන්ත ණයගැතියෝ රු. 17,764,974 ක් වුවත්, එය රු. 5,438,373 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ණයගැතියෝ රු. 12,326,601 කින් අඩුවෙන් දැක්වුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබුණු එකතුව රු. 56,428 ක් වූ වත්කම් ප්‍රාග්ධන ගතකර නොතිබුණි.

(ඌ) සතිපොළ මස්/මාළු කඩකාමර වලින් අයවිය යුතු හිඟ කුලිය රු. 875,836 ක් වුවද, එම වටිනාකම රු. 5,068,391 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබීම හේතුවෙන් ණයගැතියෝ රු. 4,192,555 කින් වැඩියෙන් දැක්වුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට නොපියවූ අත්තිකාරම් රු. 17,230 ක් වුවද, එම වටිනාකම රු. 2,949,963 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් නොපියවූ අත්තිකාරම් රු. 2,932,733 කින් වැඩියෙන් දැක්වුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට විවිධ ණයහිමියෝ රු. 21,743,052 ක් වුවද, එය රු. 27,241,260 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ණයහිමියෝ රු. 5,498,208 කින් වැඩියෙන් දැක්වුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

---------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 03 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 1,480,649 ක වෙනසක් විය.

**1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

---------------------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 30,347,288 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.4 අනුකූල නොවීම්**

--------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

-------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | |
| | (i) 149 වගන්තිය | - | සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන ලියාපදිංචි හෝටල් 02 ක ඉකුත් වර්ෂයේ ආදායමෙන් සියයට 01 ක දක්වා වූ ගාස්තුවක් ඒවා ලියාපදිංචි වූ වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව අය කරගෙන නොතිබුණි. |
| | (ii) 162 වගන්තිය | - | සභාවේ හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුල රතු නිවේදන 189 ක් නිකුත් කර තිබුණද, ඉන් ඔබ්බට ප්‍රමාණාත්මක ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

| | | |
|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 396 | 32,846 | නිකුත් කල දින සිට මාස 06 ක් ඉක්මවා තිබුණු ගෙවීම් සඳහා ඉදිරිපත් නොකල චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | 5,400,159 | 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල ටෙන්ඩර් ඇප තැන්පතු, කොන්ත්‍රාත් රඳවාගැනීම් හා විවිධ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,041,023 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,776,084 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,927,856 | 3,043,821 | 3,194,633 | 3,903,524 | 7,530,470 | 6,199,746 | 2,272,424 | 4,205,148 |
| කුලී | 6,317,300 | 4,016,018 | 4,067,850 | 5,082,076 | 4,368,460 | 328,490 | 2,927,425 | 5,133,908 |
| බලපත්‍ර ගාස්තු | 3,372,051 | 542,185 | 471,185 | - | 1,206,747 | 329,975 | 329,975 | - |
| වෙනත් ආදායම් | 9,218,437 | 8,583,336 | 1,510,087 | 16,536,420 | 10,227,575 | 9,438,712 | 10,122,612 | 9,501,284 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, කුලී, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු, වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් හා රජයේ දායකත්වය යන ආදායම්

විෂයයන්ගෙන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 19, සියයට 36, සියයට 86, සියයට 24, සියයට 73, සියයට 95 හා සියයට 43 කින් අඩුවී තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

**(අ) වරිපනම්**

2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු. 2,137,500 ක් වූ අතර, ඒ තුල වර්ෂ 05 ට වඩා වැඩි කාල සීමාවක සිට පැවත එන ඒකක 69 කින් අයවිය යුතු රු. 548,526 ක් පැවතුණි. හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් සභාවේ ක්‍රියාකාරීත්වය දුර්වල මට්ටමක විය.

**(ආ) අක්කර බදු**

2017 දෙසැම්බර් 31 දින වනවිට අයවිය යුතු හිඟ අක්කර බදු ශේෂය රු. 2,137,500 ක් වූ අතර, ඒ තුල වසර 05 ට වඩා වැඩි කාලපරිච්ඡේදයක සිට පැවත එන ඒකක 169 කින් අයවිය යුතු එකතුව රු. 131,464 ක් පැවතුණි. එම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා සභාව ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

**2.2.4 කුලී**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් කලවාන සෙනසුරාදා පොළ සඳහා 2016 වර්ෂයේ මාස 03 කට අදාලව අයවිය යුතු එකතුව රු. 408,400 ක් වූ හිඟ බදු හා දඩ මුදල් 2018 මැයි වනවිටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) සභාවට අයත් කලවාන වැද්දාගල පාර මාළු ලැල්ල සඳහා 2014 වර්ෂයේ මාස 03 කට අදාලව අයවිය යුතු රු. 169,576 ක් වූ හිඟ බදු හා දඩ මුදල් 2018 මැයි වනවිටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) සභාවට අයත් පොදු වෙළඳපල අංක 15 එළ හරක් මස් කඩය සඳහා 2014 වර්ෂයේ මාස 08 කට අදාලව අයවිය යුතු රු. 495,339 ක් වූ හිඟ බදු හා දඩ මුදල් 2018 මැයි වනවිටත් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

**2.2.5 බලපත්‍ර ගාස්තු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 08 ක් එම බලපත්‍රය ලබාගෙන නොතිබීම හේතුවෙන් සභාවට රු. 35,200 ක ආදායමක් අහිමි වී තිබූ අතර, එම ව්‍යාපාර පවත්වාගෙන යාමේදී සිදුවිය හැකි පාරිසරික බලපෑම පිළිබඳ ඇගයීමක්ද සිදුවී නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල පිහිටි පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ආයතන හඳුනාගැනීම සඳහා සභාව විසින් විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, බලපත්‍ර අළුත් කල යුතු ආයතන පහසුවෙන් හඳුනාගත හැකිවන පරිදි ලේඛන නඩත්තු කර නොතිබුණි. මේ අනුව සභා බල ප්‍රදේශයේ පරිසර ආරක්ෂණය සම්බන්ධයෙන් සභාවේ වගකීම නිසි ලෙස ඉටුකර නොමැති බව නිරීක්ෂණය විය.

**2.2.6 මුද්දර ගාස්තු**

2015 ජනවාරි සිට 2017 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා අයවිය යුතු හිඟ මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන අයකරගෙන නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 තිරසර සංවර්ධන ඉලක්ක**

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

2012 වර්ෂයට පෙර සිට පැවත එන රු. 47,340 ක අඟරු චෙක්පත් ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් නිරවුල් කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**සේවක ණය**

සේවක ණය ලේඛනය අනුව ස්ථාන මාරු ලැබීම් හා සේවය අතහැර යාම හේතුවෙන් අයවීම් හිඟහිට තිබුණු ණය ශේෂ වල එකතුව රු. 32,352 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**3.4 ප්‍රසම්පාදනය**

**ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**විගණන හා කළමනාකරණ කමිටු**

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**5.** **පද්ධති හා පාලන**

**--------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) වියදම් හඳුනා නොගැනීම |
| | | (ii) ආදායම් අඩුවෙන් සටහන් කිරීම |
| | | (iii) ලෙජර් ගිණුම් හා උපයෝගී ලේඛන නොසැසඳීම |
| | | (iv) වැය ලෙජරය හා මූල්‍ය ප්‍රකාශන නොසැසඳීම |
| (ආ) | ආදායම් පරිපාලනය | නියමිත ආදායම අයකර නොගැනීම |